ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## **පුවත්පත් නිවේදනය**

# සංචාරක කර්මාන්තය සහ වෙළඳාම තුළ ඉන්දියානු රුපියල් භාවිතා කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්වයට පත් කිරීමට සහ වර්ධනයට උපකාරී වේ

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික ගනුදෙනු සඳහා ඉන්දියානු රුපියල් භාවිතා කිරීම සම්බන්ධයෙන් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවක් 2023 මාර්තු 2 වන දින පැවැත්විණ. ලංකා බැංකුව, ඉන්දියානු රාජ්‍ය බැංකුව සහ ඉන්දියානු බැංකුව ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගත් අතර 2022 වසරේදී ඉන්දියානු සංචිත බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමේ රාමුව නිර්මාණය කිරීමෙන් අනතුරුව අදාළ වොස්ට්‍රෝ/නොස්ට්‍රෝ ගිණුම් හරහා ඉන්දියානු රුපියල් වලින් නම් කරන ලද වෙළඳ ගනුදෙනු සිදු කිරීම ආරම්භ කළ බව පැමිණ සිටි පිරිසට දැනුම් දුන්නේය. මේ සඳහා සහභාගී වන බැංකු විසින් ද ඉන්දියානු රුපියල්වලින් නම් කරන ලද පියවීම්හි ප්‍රතිලාභ විස්තර කරන ලදී. කෙටි කාලයක් ගත වීම, අඩු විනිමය පිරිවැය සහ වෙළඳ ණය සඳහා වඩා පහසු අවස්ථාවන් පැවතීම වැනි ප්‍රතිලාභ මේ අතර වේ. සංචාරක කර්මාන්තය සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයට මෙම වැඩසටහනේ

සුබදායි බලපෑම ද මෙහි දී මතුකර දැක් වූ අතර මුදල් රැස්කිරීම වේගවත් කිරීමට උපකාරී වීම සහ ඒවා අනෙකුත් අංශයන් විසින් භාවිතා කළ හැකි වීම ද මෙහි දී විශේෂයෙන් මතු කරන ලදී.

2. ඉන්දීය සංචිත බැංකුවේ කණ්ඩායමක් අන්තර්ජාලය ඔස්සේ මෙම සාකච්ඡාව සඳහා සහභාගී වූ අතර අවසරලත් ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනුවලට අමතරව භාණ්ඩ මෙන්ම සේවා ගනුදෙනු සම්බන්ධ ජංගම ගිණුම් පියවීම සඳහා ඉන්දියානු රුපියල් භාවිතා කිරීමේ හැකියාව ද පැවතින බව සඳහන් කළේය. ඉන්දියානු සංචිත බැංකු කණ්ඩායම ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සමීප සහයෝගීතාවයකින් කටයුතු කරන බව පැවසූ අතර මෙම ක්‍රියාවලියට තවදුරටත් පහසුකම් සැලසීම සඳහා සංචිත බැංකුවේ කැපවීම අවධාරණය කළේය.

3. මුදල් රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා දෙරට අතර සමීප ආර්ථික සම්බන්ධතාවය අගය කළ අතර ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබාගැනීම සඳහා අවශ්‍ය කෙරෙන ශක්තිමත් මූල්‍ය සහතික ලබා දීම ඇතුළුව පසුගිය වසර තුළ ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් මූල්‍ය සහ මානුෂීය සහය සම්බන්ධයෙන් ඉන්දියාවට ස්තුතිය පළ කළේය. ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා ඉන්දියානු රුපියල්වලින් නම් කරන ලද ගනුදෙනු ක්‍රියාවට නැංවීම සඳහා ලබා දුන් අවස්ථාවට ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාවගෙන් ඉහළ ඉල්ලුමක් පවතින බව සඳහන් කළේය. කාලයත් සමඟ මෙම පහසුකම ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ගනුදෙනුවල සමස්ත

පරාසය සඳහා ම ව්‍යාප්ත කරන ලෙස එතුමා ආරාධනා කළේය. ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ විවිධාකර පාර්ශවකරුවන් මෙම සාකච්ඡාව සඳහා සහභාගී වීම සම්බන්ධයෙන් සිය ප්‍රශංසාව පළ කළේය. මේ සඳහා 300කට අධික පිරිසක් පැමිණ සිටි අතර අන්තර්ජාලය ඔස්සේ ද විශාල පිරිසක් සහභාගී වූහ.

4. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා මෙම පියවර වෙළඳ සහ ආයෝජන ක්‍රමවේද හරහා වඩා ශක්තිමත් සහ සමීප ආර්ථික සහයෝගීතාවයක් ගොඩනැගීමට දෙරට විසින් ඒකාබද්ධව දරන ප්‍රයත්නයට මනා පිටිවහලක් වන බව ප්‍රකාශ කළේය. ඩිජිටල් ගෙවීම් ක්ෂේත්‍රය තුළ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මේ වන විට ක්‍රියාත්මක සහයෝගීතාවය සහ දෙරට අතර ආර්ථික සම්බන්ධතාවය ඉහළ නැංවීමට එයට ඇති හැකියාව සම්බන්ධයෙන් ද එතුමා අදහස් දැක්වීය.

5. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය, සංචාරක ක්ෂේත්‍රයේ නිරත වූවන්, මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැලෙන්නන්, බැංකු නියෝජිතයන්, ආර්ථික විද්‍යාඥයන් සහ මාධ්‍යවේදීන් ඇතුළු ව්‍යාපාරික සහ කර්මාන්ත නියෝජිතයන් රැසක් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මේ සඳහා සහභාගී වූහ. ඉන්දියාව නියෝජනය කරමින් ඉන්දියානු සංචිත බැංකුවේ, ඉන්දියානු රජයේ, වෙළඳ සහ කර්මාන්ත සංගම් සහ අපනයන ප්‍රවර්ධන කවුන්සිලවල නියෝජිතයෝ අන්තර්ජාලය ඔස්සේ මේ සඳහා සහභාගී වූහ.

***

***කොළඹ***
***2023 මාර්තු 03***